දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E-mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය
எனது இல.
My No.
PSC/EST/05-03/01/

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2020.07. 31

---

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 08/2020

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>සේවා ව්‍යවස්ථාවේ සහ බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි සන්ධාන භාෂා අවශ්‍යතාව සම්පූර්ණ කිරීම</u>**

සේවා ව්‍යවස්ථාවල සහ බඳවා ගැනීමේ පටිපාටිවල, සන්ධාන භාෂාව (ඉංග්‍රීසි භාෂාව) සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය සඳහන් කර ඇති අවස්ථා වලදී මේ දක්වා ගෙන ඇති තීරණයන්ට අගතියක් නොවන පරිදි පහත සුදුසුකම් සහිත නිලධාරීන් සන්ධාන භාෂාව සමත් වීමේ අවශ්‍යතාව සම්පූර්ණ කළ නිලධාරීන් ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

(අ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධිය/පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද නිලධාරීන්;

(ආ) අ.පො.ස. (උ/පෙ) විභාගයේදී ඉංග්‍රීසි විෂයය (අතිරේක විෂයයක් ලෙස නොවන පරිදි) සමත්ව ඇති නිලධාරීන්;

(ඇ) අ.පො.ස. (සා/පෙ) විභාගයේදී ඉංග්‍රීසි විෂයය සඳහා (අතිරේක විෂයයක් ලෙස නොවන පරිදි) සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා ඇති නිලධාරීන්;

(ඈ) සේවයට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාගයට ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් පෙනී සිටි නිලධාරීන්.

02. ඉහත සුදුසුකම් සනාථ කරනු ලබන ලේඛණ සහිතව නිලධාරියෙකු විසින් කරනු ලබන ඉල්ලීමක් අනුව අදාළ නිලධාරියා සන්ධාන භාෂා අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමට පත්කිරීම් බලධරයා/ පරිපාලන බලධරයා විසින් කටයුතු කළ යුත්තේ ය.

03. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධානයන් 2020.07.01 දින සිට ක්‍රියාත්මක වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්.ඒ.බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව